



## පළමුවන පරිච්ජේදය

## ශ්‍රී ලංකා 1:50,000 භූ දර්ශන සිතියම

**හැඳින්වීම**

**භූගෝල විද්‍යාවේ අත්‍යවශ්‍ය අංගයක් වූ ප්‍රායෝගික භූගෝල විද්‍යාව ප්‍රශ්න පත්‍රය යටතේ ශ්‍රී ලංකාවේ** 1:50000 **භූ දර්ශන සිතියම් අධ්‍යයනය කෙරෙහි සිසුන්ගේ අවධානය වැඩියෙන් යොමුවිය යුතු වන්නේ එම කොටසට වැඩි ලකුණු ප්‍රමාණයක් වෙන්කර ඇති නිසාය.**

**"ශ්‍රී ලංකාවේ** 1:50000 **භූ දර්ශන සිතියම් අධ්‍යයනය" යටතේ මූලික වශයෙන් පහත සඳහන් ක්ෂෙත්‍ර කෙරෙහි සිසුන්ගේ දැනුම අපේක්ෂා කෙරේ.**

1. සිතියම් නිර්මාණය
2. දෙනලද සිතියමක ලක්ෂණ හදුනා ගැනීම සහ නම් කිරීම
3. සිතියම් සංකෝචනය සහ විශාලනය
4. සිතියම් විවරණය

**සිතියමක් යනු තුමක්ද?**
**සිතියමක් යන්න පුළුල් අර්ථ දනවන්නකි. ඒ නිසාම සිතියමක් යනු කුමක්දැයි පිළිබඳ නිර්වචන රාශියක් වේ. ඒ අතර වඩාත් වැදගත් නිර්වචනයක් ලෙස අර්වින් රේස් ගේ නිර්වචනය සලකා බැලීම සුදුසුය. ඔහුට අනුව;**

**"සිතියමක් යනු බෙහෙවින් කුඩා කරන ලද පරිමාණයකට අනුව සකස් කරන ලද පෘථිවියේ මතුපිට විශාල ප්‍රදේශයක, අවකාශය පිළිබඳ වර්ණාත්මක සංකේත යොදන ලද සංක්ෂිප්ත චිත්‍රයකි"**

**ඒ අනුව සිතියමක් යනු "පිහිටීම දැක්වීම සඳහා භාවිත වන විශ්ව සම්මත මායිමක්" ලෙස නිර්වචනය කළ හැකිය.**

1:50,000 **භූ දර්ශන සිතියමෙහි අඩංගු තොරතුරු ප්‍රධාන කොටස් දෙකකි.**

1. **පර්යන්ත තොරතුරු**
2. **මුහුණත තොරතුරු**

**පර්යන්ත තොරතුරු**
**පර්යන්ත තොරතුරු යනු සිතියමේ වට තිරුව සහ ඇතුළත මායිම් තිරුව ආශ්‍රිත තොරතුරුය.**

**මුහුණත තොරතුරු**
**මුහුණත තොරතුරු යනු සිතියම ඇතුළත අන්තර්ගත තොරතුරුය. මුහුණත තොරතුරු අධ්‍යයන පහසුව සඳහා කොටස් දෙකකට බෙදිය හැකිය.**

1. **භෞතික තොරතුරු**
2. **සංස්කෘතික තොරතුරු**

**භෞතික තොරතුරු සහ සංස්කෘතික තොරතුරු කියවීම සඳහා විවිධ වර්ණ, සංකේත, රේඛා සහ සංඥා ආදිය භාවිත කෙරේ.**

**පර්යන්ත තෙරතුරු**
**පර්යන්ත තොරතුරු නැවත කොටස් දෙකකට බෙදිය හැකිය.**


1. **ඇතුළත මායිම**
2. **වට තිරුව**

**ඇතුළත මායිම**
**ඇතුළත මායිමේ කිලෝ මීටර් කොටු දැලෙහි අගයයන් සහ අක්ෂාංශ දේශාංශ අගයයන් නිරූපණය වේ.**

**වට තිරුව**
**වට තිරුව මගින් සිතියමේ අන්තර්ගත තොරතුරු කියවීම සඳහා උපකාරීවන තොරතුරු සඳහන් වේ. එම තොරතුරු පහත දැක්වේ.**

(රූපසටහන් අංක 1 මගින් දැක්වෙන්නේ මහනුවර 1:50,000 භූ දර්ශන සිතියමේ කටු සැලැස්මයි. මෙම සැලැස්ම ඇසුරින් සිතියමේ අඩංගු තොරතුරු පිළිබඳ අවබෝධයක් ලබා ගනිමු)

***රූපසටහන් අංක 1***




**A – සිතියම් ශ්‍රේණිය (Map Class)**

**සිතියම් ශ්‍රේණිය මගින් ශ්‍රී ලංකා 1: 50,000 ලෙස සිතියමේ උතුරින් පිහිටි වට තීරුවේ වම් කෙළවරේ යොදා ඇත. මෙමගින් පරිශීලනය කරන සිතියම කුමන ශ්‍රේණියකට අයත්ද යන්න හඳුනා ගත හැකිය. මෙය අඟලේ සිතියමක නම් 1:63,360 යනුවෙන් නම් කර ඇත.**

**B – සිතියම් නාමය (Map Name)**

**ශ්‍රී ලංකාව ආවරණය වන ලෙස 1:50,000 භූ දර්ශන සිතියම් 92 කින් සමන්විතය. ඒ සෑම සිතියමක්ම නම් කර ඇත. එය සිතියමේ උතුරින් පිහිටි වට තීරුවේ මැද යොදා ඇත.**
**උදා: මහනුවර**

**C – පත් අංකය (Sheet Number)**

**සියලු සිතියම්වලට අංකය බැගින් ලැබී ඇත. මෙම අංකය සඳහන් වන්නේ සිතියමේ උතුරින් පිහිටි වට තීරුවේ දකුණු කෙළවරය. ශ්‍රී ලංකාව** 1: 50,000 **සිතියම්** 92 **කින් සමන්විත වන අතර එම සිතියම්** 1 **සිට** 92 **දක්වා නම් කර ඇත. (අංක** 1 **සිතියම මානිපායි වන අතර අංක** 92 **සිතියම තංගල්ල වේ)**

***(සිතියම් අංක 1 බලන්න)***

**D – සකස් කිරීම සහ මුද්‍රණය (Prepared and Printed)**

**සිතියම සකස් කිරීම සහ එය මුද්‍රණය කරණු ලබන්නේ මිනුම්දෝරු දෙපාර්තමේන්තුව විසිනි.**

**E – පරිමාණය (Scale)**

1: 50,000 **සිතියමක පරිමාණය දැක්වීම ආකාර දෙකකින් නිරූපනය කර ඇත. එනම් පරිමාණ භාගයක් ලෙස සහ රේඛීය පරිමාණයක් ලෙසය. පරිමාණ භාගය** 1:50,000 **ලෙසත් රේඛීය පරිමාණය සෙන්ටි මීටර්** 1 **කින් කිලෝ මීටර්** 1/2 **ක් ලෙසත් නිරූපනය කර ඇත. රේඛීය පරිමාණයේ මුල් සෙන්ටි මීටර්** 2 **කොටස්** 10 **කට බෙදා ඇත.** 1: 50,000 **සිතියමේ කිලෝ මීටර් පරිමාණයට අමතරව අඟල්** 1 **කින් සැතපුම්** 1 **ක් පෙන්වනු ලබන රේඛීය පරිමාණයද ඇතුළත් කර ඇත. එම පරිමාණයේ මුල් අඟල කොටස්** 10 **කට බෙදා ඇත. එයින් කිලෝ මීටර් සහ සැතපුම් පරිමාණය සැසඳීමට පුළුවන *(රූපසටහන් අංක 2).***

**F – චුම්බක වෙනස (දිශාව) (Magnetic Variation)**


1:50,000 **සිතියමේ දිශාව දක්වන ආකාර තුනකි.**

1. **සැබෑ උතුර**
2. **චුම්බක උතුර**
3. **ජාල උතුර**

**සැබෑ උතුර යනු හිරු උදාව සහ බැසීම අනුව තීරණය කරනු ලබන උතුරයි. එනම් භූගෝලීය උතුරයි. චුම්බක උතුර යනු මාලිමාවෙහි කටුවේ තුඩ යොමුවන දිශාව අනුව තීරණය වන උතුරයි. ජාල උතුර යනු කොටු සැලැස්ම අනුව අඳිනු ලබන උතුරයි *(රූපසටහන් අංක 3).***


*සිතියම් අංක 1*

**1:50,000 සිතියම් සූචකය**




| | | | |
|---|---|---|---|
| 1 | මනිප්පායි | 45 | මඩකලපුව |
| 2 | පොයින්ට් පේද්‍රුරු | 46 | හලාවත |
| 3 | යාපනය | 47 | කුරුණෑගල |
| 4 | චාවාකච්චේරිය | 48 | මාතලේ |
| 5 | මුල්ලියන් | 49 | පල්ලේගම |
| 6 | ඩෙල්ෆ්ට් | 50 | මහඔය |
| 7 | ඉරනයිතිවු | 51 | පදිරුප්පු |
| 8 | කිලිනොච්චි | 52 | කොච්චිකඩේ |
| 9 | ඉරනම- | 53 | කෑගල්ල |
| 10 | මුලතිව් | 54 | මහනුවර |
| 11 | තලෙයිමන්නාරම | 55 | මහියංගනය |
| 12 | තුනුක්කායි | 56 | පදියතලාව |
| 13 | මාන්කුලම් | 57-58 | අම්පාර/කල්මුනේ |
| 14 | ආලම්පිල් | 59 | මීගමුව |
| 15 | මන්නාරම | 60 | අත්තනගල්ල |
| 16 | පාලම්පිඩ්ඩි | 61 | ගම්පොල |
| 17 | පදවිය | 62 | හගුරන්කෙත |
| 18 | කොකිලායි | 63 | බිබිල |
| 19 | සෙල්වතුරෙයි | 64-65 | තිරික්කෝවිල්/තම්පාඩි |
| 20 | ම- පාර | 66 | කොළඹ |
| 21 | වව්නියා | 67 | අවිස්සාවේල්ල |
| 22 | පාන්කුලම | 68 | නුවරඑළිය |
| 23 | නීලාවේලි | 69 | බදුල්ල |
| 24 | විල්පත්තුව | 70 | මොනරාගල |
| 25 | තන්තිරිමලේ | 71-72 | පොතුවිල්/කෝමාරි |
| 26 | මැදවච්චිය | 73 | කලුතර |
| 27 | හොරොව්පතාන | 74 | රත්නපුර |
| 28 | ත්‍රිකුණාමලය | 75 | බලන්ගොඩ |
| 29 | කල්පිටිය | 76 | හපුතලේ |
| 30 | කළාඔය | 77 | බුත්තල |
| 31 | අනුරාධපුරය | 78 | පානම |
| 32 | කවු- ල්ල | 79 | අළුත්ගම |
| 33 | කතිරවේලි | 80 | මතුගම |
| 34 | පුත්තලම | 81 | රක්වාන |
| 35 | ගල්ගමුව | 82 | තිඹොල්කැටිය |
| 36 | කැකිරාව | 83 | කතරගම |
| 37 | පොළොන්නරුව | 84 | යාල |
| 38 | වාකනේරි | 85 | බලපිටිය |
| 39 | කල්කුඩා | 86 | අම්බලන්ගොඩ |
| 40 | බත්තලුඔය | 87 | මොරවක |
| 41 | නිකවැරටිය | 88 | හම්බන්තොට |
| 42 | දඹුල්ල | 89 | තිස්සමහාරාම |
| 43 | ඇළහැර | 90 | ගාල්ල |
| 44 | අරලගංවිල | 91 | මාතර |
| | | 92 | තංගල්ල |

*රූප සටහන් අංක 2*




*රූපසටහන් අංක 3*




**G – පිහිටීම (Location)**

**පිහිටීම මගින් පරිහරණය කරන සිතියම වටා ඇති සිතියම් පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය. එනම් සාපේක්ෂ පිහිටීමයි. මෙය වැදගත් වන්නේ අවශ්‍ය තොරතුරු සිතියම් කීපයක පවතින අවස්ථාවකදීය. මහනුවර සිතියම වටා ඇති සිතියම් ගැන සොයා බැලීමේදී, උතුරින් මාතලේ සිතියමත්, ඊශානින් පල්ලේගම සිතියමත්, නැගෙනහිරින් මහියංගණ සිතියමත්, ගිනිකොන දිගින් හගුරන්කෙත සිතියමත්, දකුණින් ගම්පොළ සිතියමත්, නිරිත දිගින් අත්තනගල්ල සිතියමත්, බස්නාහිරින් කෑගල්ල සිතියමත්, වයඹ දිගින් කුරුණෑගල සිතියමත් පිහිටා ඇත *(රූප සටහන් අංක 4 බලන්න).***

**H – සම්පාදනය සහ සංශෝධනය (Compilation and Revision)**

**මෙමගින් සිතියම සම්පාදනය කිරීමට භාවිත කළ ක්‍රම වේදයන් පිළිබඳවත් යම් සංශෝධනයන් සිදු වූයේ නම් එහි වසර ආදියත් ඇතුලත්ය. මහනුවර සිතියමට අනුව එය 1983 ගුවන් ජායාරූප පදනම් කරගෙන සකස් කර ඇත.**


**I – පරිපාලන සීමා (Administrative Boundaries)**

**පරිහරණය කරන සිතියම තුළ තිබෙන පරිපාලන මායිම් පිළිබඳ අවබෝධයක් මේ තුලින් ලබා ගත හැකිය. පළාත් මායිම් සහ දිස්ත්‍රික් මායිම් ආදිය මෙයට ඇතුළත්ය. *(රූපසටහන් අංක 5 බලන්න)***

***රූපසටහන් අංක 4***

| | | |
|---|---|---|
| කුරුණෑගල<br>**47** | මාතලේ<br>**48** | පල්ලේගම<br>**49** |
| කෑගල්ල<br>**53** | මහනුවර<br>**54** | මහියංගන<br>**55** |
| අත්තනගල්ල<br>**60** | ගම්පොල<br>**61** | හඟුරන්කෙත<br>**62** |


***රූපසටහන් අංක 5***




**J – මායිම් (Boundaries)**

**සිතියමේ අන්තර්ගත මායිම් මොනවාද යන්න පිළිබඳවත් එම මායිම්වල වර්ණ සහ සංකේත පිළිබඳවත් අවබෝධයක් ලබා ගත හැකිය. *(රූපසටහන් අංක 6 බලන්න)***

***රූපසටහන් අංක 6***



**K – සංචාරක තොරතුරු (Tourist Information)**

**සංචාරකයන්ට අවශ්‍ය සංචාරක නවාතැන් සහ සංස්කෘතික වටිනාකම් ඇති ස්ථාන පිළිබඳ තොරතුරු මෙයට අයත්ය. *(රූපසටහන් අංක 7 බලන්න)***


***රූපසටහන් අංක 7***




**L – මංමාවත් (Roads)**

**මාර්ග සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු එනම් මාර්ග ශ්‍රේණි අනුව මාර්ග හඳුනා ගැනිමේදී ඒ සඳහා භාවිත වන වර්ණ මොනවාද යන්න පිළිබඳ තොරතුරු සහ පාලම් පිළිබඳ තොරතුරුද ඇතුළත්ය. *(රූපසටහන් අංක 8 බලන්න)***


***රූපසටහන් අංක 8***




**M – දුම්රිය මාර්ග (Railways)**

**දුම්රිය මාර්ග, බිම් ගෙවල්, පාලම්, දුම්රිය ස්ථාන, ආදිය පිළිබඳ තොරතුරු මෙයට ඇතුළත්ය. *(රූපසටහන් අංක 9 බලන්න)***


***රූපසටහන් අංක 9***




**N – ජල වහනය (Drainage)**

**මෙයට වැව්, පොකුණු, වාරි මාර්ග ඇළවල් පිළිබඳ තොරතුරු ඇතුළත්ය. *(රූපසටහන් අංක 10 බලන්න)***


***රූපසටහන් අංක 10***




**O – භූ විෂමතාව (Relief)**

**මේ යටතේ සමෝච්ච රේඛා, ත්‍රිකෝණමිතික ස්ථාන, පාෂාණ උද්ගත වැනි භෞතික තොරතුරු ඇතුළත්ය. මෙහි සමෝච්ච රේඛා වර්ග තුනක් අන්තර් ගතය. එනම් මූලික, අතර මැදි සහ අතිරේක සමෝච්ච රේඛා ලෙසය. සමෝච්ච රේඛා අන්තරය මීටර්** 20 **කි. *(රූපසටහන් අංක 11 බලන්න)***


***රූපසටහන් අංක 11***




**P - ශාක්ෂලතාවන් (Vegetations)**

**සිතියමේ අඩංගු භූමි පරිභෝගය පිළිබඳ අවබෝධයක් මේ තුලින් ලබා ගත හැකිය. *(රූපසටහන් අංක 12 බලන්න)***

***රූපසටහන් අංක 12***





**Q - වෙනත් ලක්ෂණ (Other Features)**

**මේ යටතේ මානව ලක්ෂණ (මිනිසා විසින් නිර්මාණය කරන ලද) පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත. *(රූපසටහන් අංක 13 බලන්න)***

**R - මුද්‍රණය**

**සිතියම මුද්‍රණය කළ වර්ෂය දැක්වේ. ඒ අනුව පරිහරණය කරන සිතියමේ තොරතුරු කුමන කාලයකට අයත් දැයි සොයා ගත හැකිය.**

***රූපසටහන් අංක 13***


ඉදිකළ ප්‍රදේශ
ගොඩනැගිල්ල
විශේෂ ගොඩනැගිල්ල
රතු
තැපැල් / උප තැපැල් කාර්යාලය
රතු
පොලිසිය / උසාවිය
බෞද්ධ / හින්දු සිද්ධස්ථානය
ක්‍රිස්තියානි / මුස්ලිම් පල්ලිය
ප්‍රදීපාගාරය හෝ පහන් කණුව
සංචාරක බංගලාව
රතු
රතු
පාසල / රෝහල